**ශීර්ෂය 005 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 005 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 ට අනුව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සකස්කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.85,000,000 ක් වූ ඇස්තමේන්තුගත මූලධන ප්‍රතිපාදනයෙන් රු.66,709,685 ක් හෙවත් සියයට 78 ක් ඉතිරි වී තිබුණි. | ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු නාවික හමුදාවේ ඉංජිනේරු සේවා බලකායේ ශ්‍රම දායකත්වය මත හා විවෘත වෙළඳපොලෙන් අවම මිල ගණන් යටතේ ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගෙන අලුත්වැඩියාව සිදු කර ගන්නා ලදි. සූර්යබල බැටරි පද්ධතියක් සපයා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදනය නොකිරීමට තීරණය වූ හෙයින් ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) වෙනත් වියදම් සහ කාර්ය මණ්ඩල පුහුණු වියදම් සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සියයට 200 බැගින් වැඩිකර ගෙන තිබුණද එම වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරිය | විගණනය සමඟ එකඟ වන අතර අත්‍යවශයෙන්ම පැන නැගුණු සැපයීම් අවශ්‍යතා වෙනුවෙන් පමණක් මෙම ප්‍රතිපාදන උපයෝජනය කිරීම හා කාර්ය මණ්ඩල පුහුණු සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙලින් රු.489,582 ක් හෙවත් සියයට 82 ක් සහ රු.1,096,695 ක් හෙවත් සියයට 73 ක් වීමෙන් ඇස්තමේන්තු සැකසීමේ නිවැරදි පුරෝකථනයන් සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | විදුලිය හා ජල වියදම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් සියයට 675 ක් වැඩියෙන් හා සියයට 25 ක් අඩුවෙන් ඇස්තමේන්තුගත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී එම විෂයය සඳහා මු.රෙ.66 මඟින් රු.2,500,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ නමුත් වර්ෂය අවසානයට තවදුරටත් රු.229,561 ක මුදලක් පියවා ගැනීමට හැකි වී නොතිබුණි. | විගණනය සමඟ එකඟ වන අතර නව ගොඩනැගිල්ලේ විදුලි සෝපාන කටයුතු, මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සඳහා වැය වෙතැයි අපේක්ෂිත විදුලිය හා ජල වියදම් පිළිබඳ සලකා බලා ඇස්තමේන්තු කළ ද එම වියදම් ඉහළයාමක් වර්ෂය තුළ ඇති විය. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ආහාරපාන හා නිල ඇඳුම් සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව 2022 සහ 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 8 ක් අඩුවෙන් සහ සියයට 50 ක් වැඩියෙන් ප්‍රතිපාදන ඇස්තමේන්තුගත කරතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ඇස්තමේන්තුගත මුදලින් සියයට 85 ක් හෙවත් රු.2,561,614 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීමට හේතු ලෙස දක්වා තිබූ 01/2023 , 03/2022 හා 08/2022 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදන අවුරා තිබීම හා වියදම් සීමා කිරීම යන්න විගණනයට පිළිගත නොහැකි විය . | රට තුල පැවති අධික උද්ධමන තත්ත්වය යටතේ ඇස්තමේන්තු සකස් කරන ලද අතර වියදම් උපරිම ලෙස සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරියක් විය. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදම් ලෙස 2024 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ඇතුළත් නොවූ සමාලෝචිත වර්ෂයට අදාල රු.229,561 ක විදුලි වියදම, 2024 වර්ෂයේ දී ගෙවා තිබුණි. තවද එම බැරකම පියවීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ප්‍රතිපාදන 2023 වර්ෂයේ එම වැය විෂයෙහි ඉතිරිවී නොතිබුණි. | විගණනය සමඟ එකඟ වන අතර නොවැම්බර් හා දෙසැම්බර් ජල සහ විදුලි බිල්පත්වල වටිනාකම වැඩිවීම හේතුවෙන් බිල්පත පියවීමට ප්‍රතිපාදන ප්‍රමාණයක් නොමැති විය. | වර්ෂයට අදාල සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 156(5) | 127,113 | වවුචර්වල යම් වරදක් නිවැරදි කිරීමට අවශ්‍ය වූ විට ඒ වරද තනි ඉරකින් කපා | අතපසුවීමකින් අකුරින් සඳහන් මුදල කපා දමා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | දමා කෙටි අත්සන් යෙදිය යුතු වුවත්, විශේෂ දිරිකාරක දීමනා ගෙවීමේ වවුචරයේ ඉලක්කමෙන් ලියූ මුදල නිවැරදි කර තිබුණද ඒ අනුව අකුරින් ලියූ මුදල නිවැරදි කර කෙටි අත්සන් යොදා නොතිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 232(2) හා 248(2) | 4,317,969 | වවුචරයේ ඇතුළත් උපලේඛනවල තොරතුරු සම්පූර්ණ කළ යුතු අතර උපලේඛනද සහතික කළ යුතු වුවත්, වවුචර්පත් 20 ක උපලේඛන සම්පූර්ණ කර හා සහතික කර නොතිබුණි. | විගණනය සමඟ එකඟ වන අතර ඉදිරියේදී නිවැරදිව තොරතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර්පත් හා උපලේඛන සම්පූර්ණ කර සහතික කළ යුතුය. |

**2.4 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 ජුනි 27 දිනැති අංක 279 හා 280 දරන වවුචර්පත් මඟින් පුහුණු වැඩසටහන්වල සංග්‍රහ කටයුතු සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීමේ දී එකතුව රු.4,000 ක බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. | ඉන්වොයිසිවල මුල් පිටපත් අස්ථානගත වීම හේතුවෙන් එම ගනුදෙනුවට අදාලව ආයතනයට ගෙවූ අත්තිකාරම් මුදලේ බිල්පත් පමණක් වවුචරයට අමුණා තිබුණි. නැවත ලබා ගත් සහතික කරන ලද ඉන්වොයිස් පිටපත් විගණනය වෙත ඉදිරිපත් කරන බව හා මුදල් අක්‍රමිකතාවයක් සිදු වී නොමැති බවට ද මෙවැනි අතපසුවීම් නැවත සිදු නොවීමට උපදෙස් ලබා දෙන ලදි. | ලබාගත් අත්තිකාරම් විධිමත්ව පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ අයවැය චක්‍රලේඛයේ 06 (ඇ) ඡේදය ප්‍රකාරව ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් එම පුහුණු අවස්ථා ලබා දිය යුතු වුවත්, එවැනි සුදුසුකම් සපුරාලීමට අදාල නොවූ එක් දින පුහුණු වැඩමුළුවක් 2023 සැප්තැම්බර් 23 දින ප්‍රාථමික සේවා ගණයට අයත් නිලධාරීන් වෙනුවෙන් පවත්වා තිබුණි. ඒ සඳහා රු.111,376 ක් වැය කර තිබුණු අතර ප්‍රාථමික සේවා නිලධාරීන් 26 දෙනෙක් සඳහා සැලසුම් කර තිබූ මෙම වැඩසටහනට 18 දෙනෙක් පමණක් සහභාගී වී තිබීමෙන් සියයට 31 කගේ සහභාගීත්වයක් ඒ සඳහා නොතිබුණි. | නිලධාරීන් කිහිප දෙනෙකුගේ පෞද්ගලික හේතු මත එම වැඩසටහනට සහභාගි වී නොමැති අතර මෙවැනි ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක ඇති වැදගත්කම පිළිබඳව ඔවුන් දැනුවත් කර ඉදිරියේදි එවැනි වැඩසටහන් සඳහා අනිවාර්යයෙන් සහභාගීවීමට දන්වා ඇත. | චක්‍රලේඛයට අනුකූල විය යුතු අතර ඵලදායී ලෙස පුහුණු වැඩසටහන් සැලසුම් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර | විගණනය සමඟ එකඟ වන අතර ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් සිදු නොවීමට අවශ්‍ය පියවර ගනිමි. | චක්‍රලේඛයේ ඇතුළත් මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය 2023 පෙබරවාරි 14 දින ලබා දී තිබුණි.

**(ආ) ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපතක් විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ අනුමැතිය ලබා දී තිබුණේ 2023 අප්‍රේල් 20 වන දින වූ අතර එය විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2023 මැයි 10 දිනය. | විගණනය සමඟ එකඟ වන අතර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පමණක් සකස් කිරීම ප්‍රමාද විය. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 3.2 වත්කම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1.6 වගන්තිය අනුව සෑම මුදල් වර්ෂයකම මාර්තු 31 දිනට පෙර ඉකුත් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2024 මැයි 03 දිනය. එසේම 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවද මාස 8 ක කාල පමාවකින් පසු 2023 දෙසැම්බර් 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | විගණනය සමඟ එකඟ වේ. 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා හැකි ඉක්මනින් විගණනය වෙත ඉදිරිපත් කරන අතර 2022 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සහ ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය අතර තිබූ නොගැලපීම් හේතුවෙන් නැවත සමීක්ෂණයක් සිදු කිරීමට සිදු වූ බැවින් සමීක්ෂණ වාර්තා විගණනය වෙත ලබා දීමට ප්‍රමාද විය . | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල කාල පරිච්ජේදය තුළ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ වර්ග 8 ක ඒකක 40 ක් බඩු වට්ටෝරු ලේඛනවලට ඇතුලත් වී නොතිබුණු අතර භාණ්ඩ වර්ග 9 ක ඒකක 46 ක අතිරික්තයක්ද භාණ්ඩ එක් ඒකකයක ඌනතාවයක්ද විය. | විගණනය සමඟ එකඟ වේ. | භාණ්ඩ නිවැරදිව බඩු වට්ටෝරු ලේඛනවලට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හා 881(ii) ප්‍රකාරව කාර්යාලයේ ඇප තැබීම් සිදු කළ යුතු නිලධාරින්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් මේ වන විට තීරණය කර ඇති අතර එම නිලධාරීන් වෙතින් ඇප ලබා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීම් සිදු කළ යුතු නිලධාරින්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 123 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 88 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 35 ක් එනම්, අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 28 ක් විය. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක් වීමෙන් කාර්යාලයේ කාර්ය සාධනයට යම් බලපෑමක් විය හැකි බව විගණනයට බැහැර කළ නොහැක. | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ පවතින දැඩි හිඟය හේතුවෙන් එම තනතුර පිරවීම ගැටලු සහගතය.නීති නිලධාරී තනතුර සඳහා 2024.04.03 දින සිට පත්වීම් ලබා දී ඇත.ද්විතීය හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු තනතුරු සඳහා හඳුනාගත් නිලධාරීන් ස්ථාන මාරු කරවා ගැනීම සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතු වේ. |